# සංක්‍රාන්තියඃ පාසල වෙත සාර්ථක ආරම්භයක්

*Transition Learning and Development Statement* සම්පූර්ණ කිරීමට පවුල් හට උපකාර කිරීමට මාර්ගෝපදේශ

## පාසලට සක්‍රීය ආරම්භයක් අවශ්‍ය වන්නේ කුමක් නිසාද?

පාසල වෙත සක්‍රීය ආරම්භයක් ලබාදීම මගින් සංක්‍රාන්ති කාලයේදී සහ ඉන් පසුව ඔබගේ දරුවා හට වඩා හොඳ ඉගෙනීමේ අවස්ථා සහ සුභසිද්ධි ප්‍රතිඵල ලබාදීමට හේතුවේ. ඵලදායී සහ සක්‍රීය සංක්‍රාන්තිය තහවුරු කිරීම මගින් ඔබගේ දරුවාගේ අඛණ්ඩ ඉගෙනීමට සහ සංවර්ධනයට උපකාරවේ. අඛණ්ඩව ඉගෙනීම වෙත වඩා වැඩි අවධානයක් යොමු කිරීම මගින් පිළිගනු ලබන්නේ ඔබගේ දරුවාගේ පෙර සහ වර්තමාන අත්දැකීම් මගින් ඔවුන් හට ආරක්ෂාකාරීබව, විශ්වාසය ඇතිවීම සහ මිනිසුන්, ස්ථාන, ඉසව්, දිනචරියාවන් සහ අවබෝධය සමග සබඳතා ගොඩනගා ගැනීමට උපකාරවන බවයි. පාසල වෙත සක්‍රීය ආරම්භයක් ලබාදීම සහ තරුණ අය අතර ප්‍රත්‍යාස්ථිය ප්‍රවර්ධනය කිරීම අතර ඍජු සහසම්බන්ධතාවයක් ඇත.

## TRANSITION LEARNING AND DEVELOPMENT යනු කුමක්ද?

දරුවන්ගේ ඉගෙනීම සහ සුභසිද්ධිය පෝෂණය කිරීම සම්බන්ධයෙන් බාල ළමාවිය සේවා, පාසල්, පාසල් වේලාවෙන් පිටත රැකවරණ (Outside School Hours Care (OSHC)) සේවා සහ පවුල් යන සියළුම දේ හවුල්ව කටයුතු කරයි. සේවා, පාසල් සහ පවුල් සහ පුද්ගලයන් සමග තොරතුරු බෙදාහදා ගැනීම පහසු කිරීම සඳහා සෑම දරුවෙකුම පාසලට යනවිට Transition Learning and Development Statement (සංක්‍රාන්ති ප්‍රකාශනය) ලියනු ලබන්නේ බාල ළමාවිය සේවාව මගිනි.

සංක්‍රාන්ති ප්‍රකාශනය මගින් බාල ළමාවිය සේවා සහ පාසල අතර ඔබගේ දරුවාගේ ඉගෙනීම, සංවර්ධනය සහ සුභසිද්ධිය සම්බන්ධ තොරතුරු බෙදාහදා ගනී. සංක්‍රාන්ති ප්‍රකාශනය මගින් ඔබගේ දරුවා උනන්දුවන දේ, ඔවුනගේ කුසලතා සහ හැකියාවන් සාරාංශගත කරන අතර ඔබගේ දරුවාගේ ඉගෙනීමේ සංචාරයේදී ඔවුනට උපකාර කල හැකි තනි පුද්ගල ප්‍රවේශයන් සහ ඉගැන්වීමේ උපාය මාර්ග හඳුනා ගනී.

සංක්‍රාන්ති ප්‍රකාශනය මගින් ඔබගේ දරුවා පාසල වෙත සංක්‍රාන්ති වන විට ඔබගේ දරුවාගේ ඉගෙනීමට උපකාර කිරීමට හැකි ආකාරය අවබෝධ කර ගැනීමට, උපකාර කිරීමට, ඒ සම්බන්ධයෙන් සන්නිවේදනය කිරීමට, සහ ඉගෙනීමට පක්ෂව කථා කිරීමට ඔබට උපකාර ලබාදේ. සංක්‍රාන්ති ප්‍රකාශනයේ ඇති තොරතුරු මගින් මුල් පංතිවල සිටින ගුරුවරුන් හට ඔබගේ දරුවා ගැන දැන ගැනීමට සහ සුදුසු ඉගෙනීමේ සහ ඉගැන්වීමේ වැඩසටහන් සැලසුම් කිරීමට උපකාරවේ. ඔබගේ දරුවා OSHC වෙත යැවීමට ඔබ සැලසුම් කරන්නේ නම්, සංක්‍රාන්ති ප්‍රකාශනය මගින් OSHC සේවාවල නියැලීම සහ වටපිටාව අතර අඛණ්ඩ සම්න්ධතාවයට උපකර කිරීමට OSHC ශික්ෂකයන් හට සැලසුම් කිරීමට උපකාර කෙරේ.

සංක්‍රාන්ති ප්‍රකාශනයේ ඔබගේ දරුවාගේ නම, උපන් දිනය, ඡායාරූපය, ඔබගේ නම සහ ඔබ හා සම්බන්ධවීමේ විස්තර ආදී සමහර පුද්ගලික තොරතුරු ඇත. එසේම ඔබගේ දරුවා හට උපකාර කරන වෙනත් බාල ළමාවිය වෘත්තිකයන්ගේ නම් සහ සම්බන්ධවීමේ තොරතුරුද ඇතුලත්ව තිබිය හැකිය.

ඔබගේ දරුවාගේ සංක්‍රාන්ති ප්‍රකාශනයට දායක වීම මගින් පාසලට යන ගමන ආරම්භ කිරීමට සහ පාසල් වසර පුරා ඔබ හා ඔබගේ දරුවා හට පාසලට සංක්‍රාන්තිවීමේ ක්‍රියාකාරකම්වලට සහභාගි වීමට හැකි එක ආකාරයකි.

---

## සංක්‍රාන්ති ප්‍රකාශනයේ කුමන කොටස මා විසින් සම්පූර්ණ කල යුතුද?

*1 සහ 1.1 කොටස් සම්පූර්ණ කරන්නේ ඔබගේ දරුවාගේ බාල ළමාවිය ශික්ෂකයා විසිනි.*

*ඔබගේ දරුවා හට වර්ධනයවීමේ ප්‍රමාදයක් හෝ ආබාධිතබවක් ඇතිනම්, 1.2 කොටස ඔබගේ දරුවාගේ බාල ළමාවිය ශික්ෂකයා විසින් සම්පූර්ණ කරනු ඇත. ඔබගේ දරුවා හට උපකාර කරන වෙනත් බාල ළමාවිය වෘත්තිකයන්ද මෙම කොටස සම්පූර්ණ කිරීමට දායක වනු ඇත.*

*2 වන කොටසඃ දරුවා,* මෙම කොටස දරුවා විසින් දරුවාට පහසුබව හැඟෙන වැඩිහිටියෙකු සමග සම්පූර්ණ කල යුතුය. මෙයට ඔබ හෝ ඔබගේ දරුවාගේ බාල ළමාවිය ශික්ෂකයා ඇතුලත්විය හැකිය.

*3 වන කොටසඃ පවුල,* යන කොටස ඔබ විසින් සම්පූර්ණ කල යුතුය. ඔබගේ දරුවාගේ සංක්‍රාන්ති ප්‍රකාශනයට ඔබ දරුවා සම්බන්ධයෙන් සිතන ආකාරය සහිතව දායකත්වය ලබාදීම වැදගත්වේ. ඔබට උපකාර කිරීමට මෙම කොටසෙහි ප්‍රශ්න ගණනාවක් අසා ඇත. මෙම ප්‍රශ්න සමහරකට හෝ සියල්ලටම පිළිතුරු සැපයීම මගින් ඔබගේ දරුවාට සහ ඔබගේ පවුලේ අයට නිසි ආකාරයට ප්‍රතිචාර දැක්වීමටත්, ඔබගේ දරුවාගේ ඉගෙනීම සහ සංවර්ධනයට උපකාර කිරීමටත් දරුවාගේ ගුරුවරයාට සහ OSHC ශික්ෂකයා (අදාල අවස්ථාවල) හට උපකාරවේ.

---

## සංක්‍රාන්ති ප්‍රකාශනයේ මාගේ කොටස සම්පූර්ණ කිරීමෙන් පසු කුමක් සිදුවේද?

ඔබ *3 වන කොටසඃ පවුල,* සම්පූර්ණ කල පසු, අදාල කොටස ඔබගේ දරුවාගේ බාල ළමාවිය ශික්ෂකයා වෙත යවන්න. ඔබ *2වන කොටසඃ දරුවා,* යන කොටස සම්පූර්ණ කිරීමට දරුවාට උපකාර  කලේ නම්, එම කොටස 3වන කොටස සමග යවන්න.

ඔබගේ දරුවාගේ බාල ළමාවිය ශික්ෂකයා විසින් සංක්‍රාන්ති ප්‍රකාශනයේ ඉතිරි සියළුම කොටස් සම්පූර්ණකර ඔබට සම්පූර්ණ පිටපතක් ලබාදෙනු ඇත.

ඔබගේ දරුවාගේ බාල ළමාවිය ශික්ෂකයා විසින් සම්පූර්ණකල සංක්‍රාන්ති ප්‍රකාශනයේ පිටපතක් ඔබගේ දරුවාගේ පාසල සහ OSHC සේවාව (අදාල අවස්ථාවල) වෙත ලබාදෙනු ඇත.

ඔබගේ දරුවා කුමන පාසල වෙත යන්නේද යන්න ඔබ තවම නොදන්නේ නම්, ඔබගේ දරුවාගේ බාල ළමාවිය ශික්ෂකයා විසින් සංක්‍රාන්ති ප්‍රකාශනයේ දෙවන පිටපතක් ඔබට ලබා දෙන අතර ඔබ ඔබගේ දරුවාව පාසලට ඇතුළුකල විට ඔබගේ දරුවාගේ පාසලට එම පිටපත ලබාදිය හැකිය.

*3වන කොටසඃ පවුල,* සේවාව වෙත නැවත ලබා දුන්නේ නැතිනම්, ඔබගේ දරුවාගේ බාල ළමාවිය ශික්ෂකයා විසින් ඔබගේ දරුවාගේ පාසල සහ OSHC සේවාව වෙත

(අදාල අවස්ථාවල) සම්පූර්ණකල කොටස්වල පිටපත් ලබාදෙන අතර ලබාදුන් කොටස්වල පිටපතක් ඔබට තබා ගැනීමට ලබාදෙනු ඇත.

පර්යේෂණ සහ පාසල් මගින් ලබාදුන් පසුපෙවුම් මගින් පෙන්වා දෙන්නේ මෙම තොරතුරු බෙදාහදා ගැනීම මගින් පාසල වෙත සාර්ථකව සංක්‍රමණය වීමට උපකාරවන බවයි. කෙසේවුවද, ඔබගේ දරුවා සම්බන්ධ අදාල තොරතුරු ඔබගේ දරුවාගේ පාසල සමඟ බෙදාහදා ගැනීමට අකමැතිනම්, ඔබගේ බාල ළමාවිය ශික්ෂකයා සමඟ මෙය සාකච්ඡා කරන්න.

## වැඩිදුර විස්තර සඳහා

කරුණාකර www.education.vic.gov.au/transitiontoschool වෙබ්අඩවිය වෙත පිවිසෙන්න

මෙම ලියවිල්ල ප්‍රජා භාෂා ගණනාවකට පරිවර්තනය කර ඇත. www.education.vic.gov.au/transitiontoschool යන වෙබ්අඩවියට ප්‍රවේශවීම මගින් මෙම තොරතුරු ලබාගත හැකිය.